ආරම්භය: 1945 09 30 ලි.ප. අංකය: කො 30/482
දෙහිවල, සුදර්ශන පාරේ, ශ්‍රී සුදර්ශන ධර්ම නිකේතනයේ පිහිටි දෙහිවල බෞද්ධෝදය ස
මඟින් ධර්ම දානම පිණිස සෑම පුර පසළොස්වක පොහෝ දිනයක්
පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.



# බෞද්ධෝදය

"ධම්මො හවේ රක්ඛති ධම්මචාරිං"

72 වර්ෂය - ශ්‍රී බු.ව 2560 | 2017 ජනවාරි 12 | දුරුතු කලාපය

ශාස්ත්‍රපති
පූජ්‍ය උඩරුගමුවේ අස්සජි හිමි

## යසස වැඩීමට නම්...

"උට්ඨානවතො සතිමතො
සුචිකම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො
අප්පමත්තස්ස යසො'භිවඩ්ඪති

(ධම්මපදය - අප්පමාද වග්ගය)

ඉහත දැක්වූයේ මෙවර බෞද්ධෝදය සදහම් පත්‍රිකාව සඳහා මාතෘකා කරගත් ගාථා ධර්මයයි. එය ධම්මපදයෙහි අප්පමාද වග්ගයට අයත්ය. එහි සරල සිංහලාර්ථය මෙසේය.

නො පසු බස්නා වීර්ය ඇති, එළඹ සිටි සිහි ඇති නිදොස් ක්‍රියා ඇති, නුවණින් විමසා බලා තම කටයුතු කරන සුලු වූ කය වචන දෙකින් හික්මුණු, දැහැමින් දිවි පවත්වන නොපමා තැනැත්තාගේ යසස (කීර්තිය) වැඩේ.

බුදුරජාණන් වහන්සේ විසින් මෙම ගාථා ධර්මය දේශනා කරන ලද්දේ කුම්භඝෝෂක සිටාණන් අරභයා. කුම්භඝෝෂක සිටුතුමා උපතින්ම විශාල ධනයකට උරුමකම් කී අයෙකි. එකල අහිවාතක නම් වූ දරුණු වසංගත රෝගයක් පැතිරීම නිසා දෙමාපිය උපදෙසින් කඳු ප්‍රදේශයකට ගිය ඔහු එහි වසර ගණනාවක් වාසය කොට ආපසු උපන් ප්‍රදේශයට පැමිණියේය. කුඩා කල ගොස් තරුණ වියේදී පැමිණි හෙයින් කිසිම අයෙකුට

ඔහුව හඳුනා ගැනීමට නොහැකි විය. ඔහු කුඩාකල දීම හතළිස් කෝටියක් පමණ වූ ධනය අසවල් තැන නිධන්කොට ඇතැයි, දෙමව්පියන් විසින් පෙන්වා දී තිබිණ එබැවින් ඔහු එම ලකුණු අනුව වස්තුව තිබුණු ස්ථානයට ගොස් ධනය විනාශයට පත් නොවූ බව දැන''මා හඳුනන කිසිම කෙනෙකු නොමැති හෙයින් මා මෙම ධනය ගොඩගෙන ප්‍රයෝජන ගන්නේ නම් එක්තරා දුප්පත් පුද්ගලයෙක් නිධානයක් පැහැරගෙන ඇතැයි, මා අල්ලා ගෙන බොහෝ දඬුවම් දෙනු ඇත. එම නිසා බැළ මෙහෙවර කොට ජීවත්වන්නේ නම් වඩා හොඳ යැයි, අදහස් කෙළේය. දිනක් ඉතා දුප්පත් අයෙකු මෙන් සැරසුණු ඔහු ආහාරය අවශ්‍ය වියදම පමණක් ලබාගැනීමේ අදහසින් ඊට සුදුසු රැකියාවක් සොයා ගත්තේය. එනම් උදෑසනින්ම නැගිට මිනිසුන් ඒ ඒ කටයුත්තෙහි යෙදවීමට නියෝග දීමේ රැකියාවයි. පසුව එක් දිනක් බිම්බිසාර රජතුමාට අනුන්ට නියෝග කරමින් ඇවිදින ඔහුගේ හඬ ඇසුණේය. බිම්බිසාර රජුට සෑම දෙනෙකුගේම ශබ්දය අනුව යමක් කීමට හැකියාව තිබිණ. එම නිසා කුම්භඝෝෂකගේ කටහඬ අසා ඒ බොහෝ වස්තුව ඇති මිනිසෙකුගේ ශබ්දයක් බව කිය. ඉන්පසුව රජතුමා ළග සිටි එක්තරා අන්තඃපුර ස්ත්‍රියක් ''රජතුමා සාමාන්‍ය නිකම් වචනයක් නොකියන කෙනෙකු හෙයින් මෙම කාරණය විසින් විමසා බැලිය යුතු යැයි සිතුවාය. සිය දියණිය ද සමග එක්ව සම්‍යක් උපායශිලි ක්‍රමයක් අනුගමනය කොට කුම්භඝෝෂක තෙමේ රජු ඉදිරියට පැමිණ වූහ. රජු ඔහු අමතමින් ''පිරුණු කලයක හැඩ හුරුකම ඇති කුම්භඝෝෂක නම් ඔබ දැයි, විමසුවේ. ඔහු ''එසේ'' යැයි පිළිතුර දුන්නේය. නැවත ද රජු ඔහු අමතමින් ''මේ පමණ වස්තු සමූහයක් විනාශ නොකර පිරිමැස්මෙන් තබාගෙන අපටත් කොටසක් නොදී නුඹ ම ප්‍රයෝජන විඳින්නේ ඇයි දැයි විමසීය. ''රජතුමනි, මට පිහිටක් නැතැයි, ඔහු කීය. එවිට මට වඩා පිහිටක් තවත් වුවමනා කරන්නේ දැයි රජු විමසීය. ''එලෙස පිහිට වන්නේ නම් එය ඉතා හොඳ යැයි'' කුම්භඝෝෂක කියූ පසු ''මම පිහිට වෙමි. ඔබ ගේ වස්තුව කොපමණ ප්‍රමාණයක් ඇත්තේ දැයි රජු ඇසීය. එවිට ඔහු ''වැඩියෙන්ම නැත, හතළිස් කෝටියක් පමණ තිබේ යැයි කීය.

පසුව සිය ගණනක් කරත්ත යවා වස්තුව ගෙන්වාගෙන රජ ගෙයි මිදුලෙහි ගොඩගස්වා නගරවාසීන් ගෙන්වා ගත් රජු ''මේ නගරයෙහි මේ තරම් වස්තුව තිබෙන්නේ කාට දැයි, විමසීය. ''කවරෙකුටවත් නැතැයි'' , ඔවුහු පිළිතුරු දුන්හ. එවිට රජු මේ තරම් වස්තුව ඇති කෙනෙකුට කළ යුත්තේ කුමක්දැයි, විමසීය. ''යෝග්‍ය තනතුරක් දෙන්නේ නම් හොඳ යැයි, ඔවුහු කීහ, පසුව මහත් උත්සාවාකාරයෙන් ඔහුව සිටු තනතුරට පත් කළ රජු ඔහු ළගම ආරක්ෂා වී සිටි සිය දියණිය එතරම් සාරවත් මිනිසුන් අහිමි නොකර ගත යුතු නිසා ඔහුටම විවාහ කොට දී ලෞකික වශයෙන් වටිනා සම්පත් ද ලබා දුන්නේය. පසුව ඔහුත් සමග බුදුරදුන් හමුවට ගිය රජු උන්වහන්සේට වැඳ මෙසේ පැවසීය, ''ස්වාමීනි, මොහු දැක තිබේද? මොහු තරම් ධනවත් කෙනෙක් තවත් නැත. හතළිස් කෝටියක් ධනය ඇති නමුත් මොහුට අධික සතුටක් හෝ ආඩම්බරයක් හෝ නොමැත. කිසිම දෙයක් නැති දුප්පත් අයෙකු මෙන් මෙහෙකරුවන්ට මෙහෙකාරකම කරමින් සිටියි. මම මොහු කෑ ගසමින් ඇවිදින විට ඒ කටහඩින්ම මොහුට ධනය ඇති බව දැන ගතිමි. පසුව මෙවැනි වූ උපදේශයකින් මොහුව ගෙන්වා ගතිමි. පසුව ඔහුට සිටු තනතුර දී ඔහුගේ වස්තුව ඔහුටම භාර දුන්නෙමි. ඔහු ගේ වටිනාකම දැන අපගේ දියණියකුත් ඔහුටම විවාහ කර දුන් මම ඔහුත් සමග නෑකමක්ද ඇති කර ගතිමි. මේ තරම් උතුම් මිනිසෙකු මා නම් දැක නැත. බුදුරදුන් එය අසා ''මහ රජතුමනි, යම්කිසි කෙනෙක් මේ ආකාරයට ජීවත් වෙත් නම් එය ඉතා අගය කළ යුතු දෙයකි. අනුන් සතු දේ පැහැර ගැනීම ආදිය සිදු කිරීමෙන් කරන දිවි පැවැත්ම තමාට මෙලොව දී දඩුවම් ආදියට පැමිණීමට සිදු වීම නිසා දුක් ගෙන දෙයි. පරලොව සඳහා ද ඒ නිසා සිදුවන සැපයක් නැත. සම්පත් නොමැති නමුත් සතර ආකාර වූ **උපන් අකුසල් දුරු කිරීම, නුපන් අකුසල් නො ඉපදවීම, උපන් කුසල් වැඩි දියුණු කිරීම හා නුපන් කුසල් ඉපදවීම** යන මනා කොට සිත පිහිටුවා කරන වීර්යය නිවැරදි ලෙසටම සිදු කළ යුතුය. ප්‍රකාශ කරන දෙය හොඳින් ප්‍රකාශ කොට, සිතන දෙය ද පින් සිත වැඩෙන අයුරින් නිවැරදි ලෙසම සිතිය යුතුය. නැවත හේතුව බලා කරන ප්‍රතිකාරයක් මෙන් මෙන් මෙසේ කළ විට මෙවැනි දෙයක් වේය, යන අදහසින් යුතුව සෑම දෙයක් කෙරෙහිම මනා පරීක්ෂාවෙන්

යුතුවම අනුන්ට යමක් නො පැවසිය යුතුය. ගිහි ගෙයි වාසය කරන්නේ නම් තරාදියෙන් කිරන විට අඩුවෙන් කිරීම හා මනින විට අඩුවෙන් මැනීම ආදී වැරදි දේ සිදු නොකොට කෘෂිකර්මය හා වෙළඳාම ආදී නිවැරදි දිවි පැවැත්මෙන් ද සතුන්ගතව සිටින්නේ නම් ඇති නුගුණ සැගවීම හා නැති ගුණ ප්‍රකාශ කිරීම යන වැරදි පැවැත්ම අත්හැර ධර්මයට එකගව සාමයෙන් ප්‍රමාද රහිතව වාසය කරන්නා හට සම්පත් වර්ධනය වන්නේ යැයි දේශනා කළහ. ධර්මය දේශනා කර අවසන් වූ විට කුම්භඝෝෂක සිටුතුමා තමා වාසය කළ ආකාරය පිළිබඳ සැලකිලි ලැබූ නිසා රජතුමාම කළ උදව් ඇතිව හතළිස් කෝටියක් වස්තුවටත් වඩා හරවත්ව රැකියා යුතු වූ සෝවාන් ඵලයට පත් වීමෙන් බුදුරදුන් වෙතින් ලෝකෝත්තර සැපතත් සලසා ගත්තේය. මේ අනුව නොපසු බස්නා වීර්ය ඇති, එළඹ සිටි සිහි ඇති නිදොස් ක්‍රියා ඇති, නුවණින් විමසා බලා තම කටයුතු කරන සුලු වූ කය වචනය දෙකින් හික්මුණු දැහැමින් දිවි පවත්වන නොපමා තැනැත්තාගේ යසස හෙවත් කීර්තිය වර්ධනය වන බව අප තරයේ සිත් හි තබා ගත යුතුය.